**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය**

**දෙවන සෙමෙස්තරය - 2018**

**CMS 2215 - සන්නිවේදනය සහ සංවර්ධනය**

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න　　　　　　　　කාලය පැය දෙකයි

---

01. 'සංවර්ධනය පිළිබඳ සංකල්පයෙහි මුඛ්‍යාර්ථය හා අපේක්ෂාව සමස්ත සමාජයෙහි යහපත පිණිස හේතු වන 'සමාජීය වෙනස' සාක්ෂාත් කරගැනීමයි.' සාකච්ඡා කරන්න.

*(ලකුණු 20)*

02. 'ශීඝ්‍ර සමාජ පරිවර්තනයක් උදා කරගැනීමේදී සංවර්ධනය සඳහා වන සන්නිවේදනය පිළිබඳ සංකල්පය මානව සන්නිවේදනය සමග අවියෝජනීය ලෙස බැඳී පවතී.' නෝරා සී. කබ්රාල්ගේ මතවාදී දායකත්වය ඇසුරින් විග්‍රහ කරන්න.

*(ලකුණු 20)*

03. 'සංවර්ධන සැලැස්මක් සම්පාදනයේදී උපයෝගී කරගත හැකි සංවර්ධනය සඳහා වන සන්නිවේදන චක්‍රය (C 4 D Cycle), එහි එක් එක් අදියර කෙරෙහි සාවධාන ව විග්‍රහ කොට දක්වන්න.

*(ලකුණු 20)*

04. 'සමකාලීන මාධ්‍ය තුළ සංවර්ධන ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී ප්‍රස්තුත ක්ෂේත්‍ර පිළිබඳ ගැඹුරු හා විශ්ලේෂණාත්මක විස්තරකථන දක්නට ලැබෙන අවස්ථා විරල ය.' විචාරාත්මක ව අදහස් දක්වන්න.

*(ලකුණු 20)*

*(අනෙක් පිටුවට)*

05. විවිධ සංවර්ධන සන්නිවේදන ආකෘති හඳුන්වා දී සංවර්ධන සන්නිවේදනය පිළිබඳ මූලිකාංග වටහා ගැනීමෙහි ලා ඒවායේ වැදගත්කම විස්තර කරන්න.

*(ලකුණු 20)*

06. විවරණ සපයන්න.

(අ) සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ජාත්‍යන්තර සංවිධාන හා රාජ්‍ය නොවන දේශීය සංවිධානවල කාර්යභාරය.

(ආ) ජාත්‍යන්තර සංවිධාන ස්වකීය අභිමතාර්ථ සාධනයෙහි ලා සන්නිවේදනය හා ජනමාධ්‍ය උපයෝගී කරගැනීම.

*(ලකුණු 20)*

07. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> තෝරාගෙන විවරණ සම්පාදනය කරන්න.

i. ධර්මපාල චින්තනය හා ජාතික සංවර්ධනය
ii. තිරසර සංවර්ධන අරමුණු
iii. සංවර්ධන කාර්යයෙහි ලා නවමාධ්‍ය භාවිතය
iv. නවෝත්පාදන විසරණ න්‍යාය
v. සංවර්ධන සන්නිවේදකයකුගේ භූමිකාව

*(එක් සටහනකට ලකුණු 10 බැගින්)*